# කියවීම් ද්‍රව්‍යය

# 10 ශ්‍රේණිය
# ඉතිහාසය



## ඒකකය 2
## ශ්‍රී ලංකාව ජනාවාස වීම - 02







# පූර්ව ඓතිහාසික යුගය

අයි.එම්.ධම්මික කුමාර ඉලංකෝන් (ගුරු උපදේශක)
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල

# පූර්ව ඓතිහාසික යුගය

## පූර්ව ඓතිහාසික යුගය හැදින්වීම



ශ්‍රී ලංකාවේ පූර්වඓතිහාසික යුගයේ ආරම්භ වන්නේ කි.පූ 2400 දී පමණය . ශ්‍රීලංකාවේ මානවයා ශිලා මෙවලම් භාවිතය ක්‍රමයෙන් අතර හැර යකඩ භාවිතය ආරම්භ වූ අවධිය පූර්ව ඓතිහාසික යුගයේ ආරම්භයයි. ආදි ලාංකික මානවයා යකඩ භාවිතා කළ බවට පැරණිම සාදක හමුවන්නේ බෙරගල සුසාන භූමියෙන්ය. එම සුසානභූමියෙන් හමු වූ යබොර කැබැල්ල කි.පූ 2400 ට කාල නිර්ණය කර ඇත. ඒ අනුව කි.පූ 2400 සිට කිපූ 600 දක්වා කාල වකවානුව ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් වේ.

## ප්‍රාග් ඓතිහාසික ගල් යුගයත් පූර්ව ඓතිහාසික යුගයත් අතර වෙනස්කම්

- සංචාරී ජීවිතය ක්‍රමයෙන් අතහැර ස්ථිරවාසීතාවයට හුරුවීම
- නිවාස ඉදිකිරීම ,ස්ථිර ජනාවාස බිහිවීම
- දඩයම හා වන ද්‍රව්‍ය රැස් කිරීම අතහැර ක්‍රමයෙන් කෘෂිකර්මාන්තයට හුරුවීම.
- ශිලා මෙවලම් භාවිතය ක්‍රමයෙන් අතහැර යකඩ මෙවලම් භාවිතයට හුරුවීම.
- පිලිස්සූ මැටි වළං භාවිතය.
- ක්‍රමවත් සුසාන ක්‍රම භාවිතා කිරීම.

මෙවැනි වෙනස් කමක් ඇතිවීමට යම් ප්‍රබල හේතුවක් තිබිය යුතුය. ක්‍රිස්තු පූර්ව 7000-4500 අතර කාලවකවානුවේ දී සමස්ත දකුණු ආසියානු කලාපයට ම බලපෑමක් ඇති කළ දේශගුණික විපර්යාසයක් ගැන පුරාවිද්‍යාඥයින් සහ පුරාණ දේශගුණය පිළිබඳ විශේෂඥයින් විසින් කරුණු අනාවරණය කොට තිබේ. එනම්, අයිස් යුගය අවසන් වීමත් ලෝකය උණුසුම් වීමත් මගින් කෘෂි කර්මාන්තය සඳහා වඩාත් සුදුසු පරිසර තත්ත්වයක් ගොඩනැගෙන්නට විය. එමෙන් ම ජනගහනය කැපී පෙනෙන අයුරින් වර්ධනය වූ අතර එතුළින් නව සමාජ රටාවක් කෙරෙහි යොමු වීම සිදු විය. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය පිළිබඳ පැරණිත ම සාධක අයත් වන්නේ ක්‍රිස්තු පූර්ව 2400 ටය. දැනට කර තිබෙන පුරාවිද්‍යාත්මක ගවේෂණවලට අනුව මෙම යුගයට අයත් සාක්ෂි වඩාත් පැහැදිලිව අනාවරණය වී තිබෙන්නේ සබරගමු පළාතේ ඊසානදිග කොටසෙන් සහ ඌව පළාතේ නිරිතදිග කොටසෙන් ය. මේ සමඟින් මෙම යුගයේ මානවාගේ ජීවන රටාවේ .අර්ථක්‍රමයේ හා සමාජ තත්වයේ බොහෝ වෙනස්කම් සිදුවිය. එම වෙනස එකවර සිදුනොවූ අතරඑය ක්‍රමානුකූලව සිදුවිය.

පූර්ව ඓතිහාසික යුගයේ මානවයා ක්‍රමවත් සුසාන ක්‍රමයන් භාවිතා කළ අතර එහිදී ඔවුන් සිදුකර ඇත්තේ භෂ්මාවශේෂ තැම්පත් කිරීමේ ක්‍රමයන්ය. මෙම යුගයේ මානවයා භාවිතා කළ සුසාන ක්‍රම රැසක් පිළිබඳ පුරාවිද්‍යාත්මක සාදක හමු වී ඇත. මෙහි විශේෂත්වය වන්නේ ලෝකය පුරාම මෙම යුගයේ දී එක හා සමාන සුසාන ක්‍රමභාවිතා කර තිබීමයි.



කේරළ



ඉබ්බන්කටුව



ඉන්දියාව

## මෙම යුගයේ මානවයා භාවිතා කළ සුසාන ක්‍රම



ශිලා මංජුසා ක්‍රමය

මැටි ඔරු සුසානය

හරණී ක්‍රමය

විස්තෘත ක්‍රමය

වළ ක්‍රමය

ශිලා කේතුක ක්‍රමය



මැටි ඔරු සුසාන



ශිලා මංජුසා සුසාන






හරණී සුසාන

මේ අතරින් 10 ශ්‍රේණිය විෂය නිර්දේශයට අනුව අධ්‍යයනය කරනු ලබන්නේ ශිලා මංජුසා ක්‍රමය , මැටි ඔරු සුසානය හා හරණී ක්‍රමය පිළිබඳව පමණි මෙම සුසාන මහා ශිලා සුසාන වර්ගයට අයත් සුසාන ලෙස සැළකේ.

මෙසේ විශාල ශිලා පදනම් කරගනිමින් මළවුන් වෙනුවෙන් සොහොන් නිර්මාණය කිරීම පූර්ව ඓතිහාසික සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණය විය. දැනට පූර්ව ඓතිහාසික යුගයට අයත් සොහොන් බිම් 50කට වැඩි ප්‍රමාණයක් සොයා ගෙන ඇත .මියගිය අයගේ භස්මාවශේෂ ඔහු භාවිත කළ උපකරණ හා ආහාර ද්‍රව්‍ය කුඩා හෝ විශාල හෝ මැටි බඳුන් තුළ බහා විශාල පාෂාණ පතුරුවලින් ආවරණය කිරීම ප්‍රධාන චාරිත්‍ර විධිය වූ බවට සාධක ඇත. වාර්තා වී ඇති වැඩි ප්‍රමාණය ශිලා මංජුසා සොහොන්, බරණී සොහොන් සහ මැටි ඔරු සොහොන්වේ. මෙම සුසාන ක්‍රම අතරින් වඩාත් පැරණිතම සුසාන ක්‍රමය ලෙස හඳුනාගෙන ඇත්තේ මැටි ඔරු සුසානය. ශිලා මංජුසා සෙහොන් යනුවෙන් හැඳින්වෙන්නේ ගල් පතුරු 4ක් හතර අතට තබා ඒ තුළ භස්මාවශේෂ සහිත බඳුන් තැන්පත් කොට උඩින් පැතලි ගල් පුවරුවකින් ආවරණය කිරීම යි. මෙම ක්‍රමයේ සොහොන් ඉබ්බන්කටුව, යාපහුව ගල් සොහොන් කනත්ත ,ගලේවෙලට නුදුරුව පිහිටි යටිගල්පොත්ත , රඹෑව, යාන්ඔය නිම්නය ආදි ප්‍රදේශවලින් හමු වී ඇත. බරණී සුසාන ක්‍රමයට අනුව විශාල මැටි බඳුන් තබා ඒ තුළ කුඩා මැටි බඳුන් තැන්පත් කොට ගල් පියස්සකින් ආවරණය කෙරේ. මෙම වර්ගයේ සොහොන් පොම්පරිප්පුවෙන් හමු වී ඇත. මැටි ඔරු සුසාන ක්‍රමයේදී මැටිවලින් නිර්මාණය කරන ලද ඔරුවකට සමාන නිර්මාණයක් තුළ දේහය හෝ ඇටසැකිළි බහා ආදාහනය කර තිබේ. මෙම වර්ගයේ සොහොන් රංචාමඩම, නිකවලමුල්ල, හල්දුම්මුල්ල යන ප්‍රදේශ වලින් හමු වී ඇත. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික සුසාන ක්‍රමවේද හා මැටි බඳුන් ඉන්දියානු සංස්කෘතිය හා සමාන බවක් දක්වයි.

ප්‍රාග් ඓතිහාසික යුගයේ ගත කළ දඩයම් ජීවිකාව අවසන් කර ස්ථිර ජනාවාස හා වාසස්ථාන ගොඩනගා ගැනීම මේ යුගය තුළ සිදු වූ වැදගත් ලක්ෂණයකි. ස්ථිරවාසීතාව යනුවෙන් හැඳින්වෙන මෙම ලක්ෂණය පිළිබිඹු කරන ප්‍රධාන සාක්ෂිය නම් ඒ යුගයට අයත් දැනට සොයා ගෙන තිබෙන නිවාස අවශේෂ යි. 2009 වසරේදී එවැනි නිවාසයක් රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි උඩරංචාමඩම ගම්මානයෙන් සොයා ගෙන ඇත. එම නිවාසය මීටර 10.20 x 6.80 ප්‍රමාණයෙන් සහ ආයත චතුරස්‍රාකාර හැඩයෙන් යුක්ත වූව කි. එහි ඉදිරිපස සහ පසුපස කොටස් බිත්තියකින් වෙන් කර තිබිණි. නිවසේ බිත්ති වරිච්චි මැටියෙන් ඉදි කොට තිබූ අතර වහල ඉලුක් හෝ එවැනි දෙයකින් සෙවිලි කොට තිබෙන්නට ඇත.



# පූර්ව ඓතිහාසික යුගයේ ජීවන රටාව



උඩරංචාමඩම නේවාසික ප්‍රදේශයේ කැනීම් වලදී තහවුරු කරගත් සාදක අනුව මෙම යුගයේ ජීවන රටාව පිළිබඳ යම් නිගමනයන්ට එළඹිය හැකිය.

ස්ථිර නිවාස ඉදිකර ගැනීම
කෘෂිකාර්මික ජීවිතයකට හුරුව සිටි බව
දඩයම් ජීවිතය ද අත් නොහළ බව

යකඩ මෙවලම් මෙමන්ම ශිලාමෙවලම් ද භාවිතා කළ බව
සකපෝරුව භාවිතයෙන සකස්කර වර්ණ කර පුලුස්සන ලද මැටි බඳුන් භාවිතය
රූප අලංකරණය සඳහා උනන්දුවක් දැක්වූ බව

දඩයම් ජීවිතය මුළුමනින් ම අතහැර නොදැමූ නමුත් ප්‍රධාන වශයෙන් දඩයම් ජීවිතයෙන් මිදී ආහාර නිෂ්පාදනය හෙවත් ගොවිතැන පදනම් වූ ජීවිතයකට අවතීර්ණ විය. වී වගාව සහ හෙන් වගාව ක්‍රමයෙන් ආරම්භ කොට ව්‍යාපත් කෙරිණි. ආහාර භෝග වගාවත් සමඟ ස්ථිර ජනාවාස තනාගැනීම මඟින් කුඩා ගම්මාන ආරම්භ විය. ක ගොවිතැන, ප්‍රවාහණය හා ආහාර අවශ්‍යතා සඳහා ගවයා,අශ්වයා, එ`ළුවා, යන සතුන් ගෘහාශ්‍රිතව ඇති කරනලදි. පූර්ව ඓතිහාසික යුගයේ තාක්ෂණය පිළිබඳ තොරතුරු අණාවරණය වන අවස්ථා

යකඩ මෙවලම් තනාගැනීම

වරිච්චි නිවාස ඉදිකිරීම

සකපෝරුව යොදාගෙන මැටිබඳුන් නිපදවීම වර්ණ කිරීම හා පිළිස්සීම

සුසාන ඉදි කිරීම

මැටි පබළු නිපදවීම

මෙම සෑම ක්‍රියාවක් සම්බන්ධයෙන්ම තාක්ෂණික භාවිතය පිළිබඳ තොරතුරු උඩරංවාමඩම නේවාසික ප්‍රදේශයේ කැනීම් මඟින් තහවුරු වී ඇත.